සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 09 - 2023

# සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

## I - පත්‍රය

සැලකිය යුතුයි.

- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 20 ක් ඇත. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී උපදෙස් නිවැරදිව පිළිපදින්න.

01. ''ඔවා දෙනු පරහට තමා සම්මතෙහි පිහිටා සිට'' මෙම ආප්තෝපදේශයෙන් ගම්‍ය වන අදහස තෝරන්න.
   i. අන්‍යයන්ට උපදෙස් දීමට පෙර උපදෙස් දෙන්නා යහපතෙහි යෙදී තිබිය යුතු බව.
   ii. අන්‍යයන්ට උපදෙස් දීමේ දී සම්මතය නොඉක්මවා කටයුතු කළ යුතු බව.
   iii. සම්මතය ඉක්මවා අන්‍යයන්ට අවවාද ලබා දිය යුතු බව.
   iv. අන්‍යයන් හා කටයුතු කිරීමේ දී සම්මතය පිළිබඳව අවධානය යොමු කළ යුතු බව යි.

02. අකාරාදී පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.
   i. අමාවතුර, කාව්‍යශේඛරය, ගුත්තිලය, පූජාවලිය, මුවදෙව්දාවත
   ii. අඹයහළුවෝ, නිදහසේදැහැන, මගුල්කෑම, ජාතිකතොටිල්ල, හීන්සැරය
   iii. චූලවංශය, ථූපවංශය, දීපවංශය, දාඨාවංශය, මහාවංශය
   iv. ගම්පෙරළිය, යුගාන්තය, විරාගය, කලියුගය, මිරිඟුදිය

03. ඕෂ්ඨජ අක්ෂර දෙකක් යෙදුණ පදයක් ඇති පද පේළිය තෝරන්න.
   i. පර්යාය, පරිණත, පරිමාව, පරිභාස
   ii. සයන, සසුන, සවස, සමර
   iii. කලණ, කමත, කවට, කවර
   iv. අබ, අය, අජර, අඹර

04. පහත දැක්වෙන වාක්‍යයේ පද දෙකක අක්ෂර වින්‍යාසය වැරදිය. එම වචන දෙක පමණක් නිවැරදි කර ලියන්න.
   තරුණ නවකථාකරුවන් ස්වකීය කෘති සඳහා පාදක කරගනු ලබන්නේ සංකීර්ණ සමාජ ගැටළු සහිත අනුබූතීන්ය.
   (i) ..............................................................................................................
   (ii) ..............................................................................................................

05. යුගල පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
   (i) උසුළුවිසුළු, ඉඩකඩ, හදිහූනියං
   (ii) වංහුං, හරකබාන, කලබල
   (iii) වටාපිටාව, කරදර, හරිබරි
   (iv) එළිපහළිය, බඩගෝස්තරය, පරපුටු

06. පහත දක්වා ඇති වාක්‍යයට විරාම ලක්ෂණ යොදන්න.
   අහා මොනතරම් නෙතට ප්‍රිය දසුනක් ද එය වරෙක දිලෙයි නිමෙයි.
   ..............................................................................................................................................

07. (i) කර්තෘකාරක ප්‍රථම පුරුෂ බහුවචන පදය යටින් ඉරක් අඳින්න.
   (දැරිය, දැරුවාය, දැරෙයි, දැරුවෝය)

(ii) කර්මකාරක ප්‍රථම පුරුෂ ඒකවචන පදය යටින් ඉරක් අඳින්න.

(හැඬීය, හැඬෙයි, හඬයි, හඬනු ලබයි)

08. පහත දැක්වෙන පාඨය නිවැරදි ව පද බෙදා ලියන්න.

ජීවිතයහැඩගස්වාගැනීමසඳහාඅත්‍යවශ්‍යඋපදේශලබාදෙන්නටමලියවුණුපොතපතදසාහිත්‍යයෙහිබහුලය

.......................................................................................................................................................

09. මෙම වාක්‍යවල යෙදී ඇති නිපාත පද යටින් ඉරක් අඳින්න.

(අ) වහා එතැනින් පැනගත් සාවා ජීවිතය අරබයා දිවයයි.

(ආ) පවුල් ඒකකය තුළ නිතොර ඇසෙන වචන කුඩා දරුවෝ ග්‍රහණය කර ගනිති.

10. (අ), (ආ) ප්‍රශ්නවල මුලින් දැක්වෙන පදයට විරුද්ධාර්ථයක් නොදෙන පදය තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(අ) එළිය - අඳුර, ආලෝකය, ඇඳිරිය, ගනඳුර

(ආ) කළු - ස්වේත, සුදු, ධවල, කාළ

11. මෙම වාක්‍ය හරිනම් ✓ ලකුණ ද වැරදි නම් × ලකුණ ද වරහන් තුළ යොදන්න.

(අ) බොහෝ දෙනෙකුගේ මග පෙන්වීමෙන් එක් අයෙක් ජය ලැබීය. ( )

(ආ) වෙළෙන්දෝ පාරිභෝගිකයෝ සතුටට පත් කරති. ( )

12. හිස්තැනට ගැළපෙන පදය වරහනෙන් තෝරා ඒ යටින් ඉරි අඳින්න.

(අ) ''නීති''යන පදයේ සචේතනික උක්තපදය වන්නේ .................................. ය.

(නීතිය, නීතීන්, නීතීහු, නීතියේ)

(ආ) ''වෛද්‍යවරයෙකු'' යන පදයේ අනියමාර්ථ උක්තනාම පදය ................................. ය.

(වෛද්‍යවරයන්, වෛද්‍යවරු, වෛද්‍යවරයා, වෛද්‍යවරයෙක්)

13. පහත දැක්වෙන කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයටත්, කර්ම කාරක වාක්‍ය කර්තෘ කාරකයටත් හරවා ලියන්න.

(අ) රජය විරෝධතාකරුවන් විසුරුවා හරිති.

.......................................................................................................................................

(ආ) ආධුනික ගායකයෙකු විසින් කිරුළ හිමිකර ගනු ලැබීය.

.......................................................................................................................................

14. පහත සඳහන් වාක්‍යාංශවලට ගැළපෙන තනිපදය තෝරා යටින් ඉරක් අඳින්න.

(අ) බොහෝ දුර සිතා කටයුතු කරන - (අත්තනෝමතික, දූරදර්ශී, පරාර්ථකාමී)

(ආ) ගරු කළ යුතු තත්වයේ පසුවන - (සම්භාවනීය, පූජනීය, සම්මානනීය)

15. මුලින් දැක්වෙන පදයට සමානාර්ථයක් නොදෙන පදය තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(අ) මුහුද - සින්ධු, ජලනිධි, රුවන්පුර, රුවනාර

(ආ) ගස - පාදප, ද්‍රැම, තුරු, විදුර

16. මුලින් දැක්වෙන පදයේ අර්ථයට නොගැළපෙන පදය තෝරන්න.

(අ) මුව - මුඛය, මුහුළ, මුවා, මුහුණ

(ආ) සඳ - චන්ද්‍රයා, උතුම්, සතුරු, කාලය

17. පහත දැක්වෙන පද්‍යයේ එන නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද උපුටා දක්වන්න.

ගෙඩියක් කඩාගෙන ගෙම්දුල තැඹිලි ගසින්
පිළිගැන්වීය මට සොම්නස පිරුණු ඇසින්

(අ) නාම විශේෂණ - ..............................................................................................

(ආ) ක්‍රියා විශේෂණ - ..............................................................................................

18. පහත වාක්‍යයේ ඉරි ඇඳි ඇති වචනවල අර්ථ ලියන්න.

පුහුණුකරුවන්ගේ උපදෙස් දීමේ ශක්‍යතාව නිසා ක්‍රීඩකයෝ බොහෝ ව්‍යසනවලින් මිදී කටයුතු කළහ.

(අ) ..............................................................................................................................

(ආ) ..............................................................................................................................

19. 'වපුර' යන ක්‍රියා මූලයෙන් සෑදෙන ඒ ඒ වර්ගවලට අයත් ක්‍රියා පද සාදා වගුවේ අදාළ තැන යොදන්න.

| ප්‍රයෝජ්‍ය ක්‍රියා | පූර්ව ක්‍රියා | මිශ්‍ර ක්‍රියා | අසම්භාව්‍ය ක්‍රියා |
|---|---|---|---|
| .......................... | .......................... | .......................... | .......................... |

20. ඉතිරි පාදය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

මුහුදක කිරි දුන් අම්මා
..............................................
රන් සමනොළ ගල මුදුනේ
සිරිපා පද්මය අම්මා

(ලකුණු (2 × 20 = 40)

(i) රස කර කිරි පෙවි අම්මා
(ii) මිහිකත දුක් දැරූ අම්මා
(iii) අපමණ දුක් විඳි අම්මා
(iv) ආදරයෙන් හැදූ අම්මා

---

## II - පත්‍රය

- **ප්‍රශ්න අංක 01, 02, 03 හා 04 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු ලියන්න.**

(01) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. භරත මුනි පඬිවරයා හඳුන්වා දුන් නාට්‍ය රංග ශෛලීන් දෙක නම් කරන්න.
ii. පසු වස් වසන භික්ෂූන් වහන්සේ වස් සමාදන්වීම ආරම්භ කරන්නේ කුමන පොහොය දිනකදී ද?
iii. ''පුල හෙළ කුසුම ලිය පිය තෙපල රන්'' කෙඬි
''බල සුබ නිමිති පෙර මග නැකතටත් වැඩි'' මෙම පද්‍ය පාද උපුටා ගත් සංදේශ කාව්‍ය කුමක් ද?
iv. කුමාරතුංග මුනිදාස මහතා සංස්කරණය කළ පැරණි සම්භාව්‍ය කෘති දෙකක නම් ලියන්න.
v. දිවිහදාන කෙටිකතාව රචනා කළේ කවුද?

- පහත සඳහන් ප්‍රශ්නවල හිස්තැනට අදාළ පිළිතුර වරහන් තුළ දී ඇති වචනවලින් තෝරා ලියන්න.

vi. පුවත් පත් සිරස්තල වර්තමාන කාල ආඛ්‍යාතයෙන් තැබීම .......................... පුවත්පතින් ආරම්භ කෙරුණි.
vii. නාට්‍ය රචනයේ දී වැදගත් වන්නේ.................................අභිනයයි.
viii. ''ගද්‍ය යනු, උක්ත ................................ ආඛ්‍යාත යන වචන අනුපිළිවෙළට පෙළ ගැස්වූ වාක්‍යයි.
ix. බොහෝ අභ්‍යවකාශ යෙදවුම් .................................. මූලික කොට ගෙන ඇත.
x. මීටර් සියය කෙටිකතාව ................................. දෘෂ්ටි කෝණයෙන් රචනා වූවකි.

(කර්ම, චන්ද්‍රිකා පද්ධති, ලක්මිණි පහන, උත්තම පුරුෂ, වාචික) (ලකුණු 1 × 10 = 10)

(02) පහත සඳහන් මඟ පෙන්වන ලද ඡේද අතුරින් එකක් තෝරා ගෙන වචන 200 කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.

i. පරිසරය හා ළමයා අතර සබඳතාව ගොඩ නැංවීමෙහිලා ළමා සාහිත්‍යයේ කාර්යභාරය සුවිශේෂ වේ. පරිසරයට පමණක් නොව තමා උපන් බිමට හිතැති පුරවැසියෙකු සේ ළමයාගේ පෞරුෂය වර්ධනය කිරීමට ළමා සාහිත්‍යයේ දායකත්වය වැදගත් ය. මෙම කරුණු පදනම් කරගෙන ''ළමා සාහිත්‍යයේ වැදගත් කම'' ගැන රචනාවක් ලියන්න.

ii. අප ඇති දැඩි කරන මව්පියන් තරම් උතුම් කෙනෙක් අපට නැත. ඔවුන්ට අප සැලකිය යුත්තේ ආදරයෙනි, ගෞරවයෙනි. වැඩිහිටි සියල්ලන් ම අපේ ම මව්පියන් හා සමානව සලකමින් කටයුතු කිරීමට අප අධිෂ්ඨාන කර ගත යුතු ය. මේ කරුණු පදනම් කර ගෙන ''වැඩිහිටි සැමට මව්පියන් සේ සලකමු'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

iii. පොදු ප්‍රවාහන සේවය අප සැමට අත්‍යවශ්‍ය සේවාවකි. නියමිත වේලාවට පාසලට, වැඩබිමට, කාර්යාලයට පැමිණීමට හැකි වන්නේ ප්‍රවාහන සේවය ශක්තිමත් වූවොත් පමණි. මහා මාර්ග ප්‍රතිසංස්කරණය නොවීම, ප්‍රමාණවත් පරිදි බස් රථ ධාවනයට යොදවා නොතිබීම, වාහන තදබදය ආදී ගැටලු නිසා අපට ගමනා ගමනය දුෂ්කර වී ඇත. මේ කරුණු සැලකිල්ලට ගෙන ''රටක ප්‍රවාහන සේවය ශක්තිමත් විය'' යුතුය යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

iv. තරු පිරිවරා ගත් පුන්සඳ අහසේ බබළයි. සිල් සමාදන් වූ උවැසි උවැසියෝ මල් පහන් පූජාවට සැරසෙති. විහාරස්ථානය ම මල් සුවඳින් පහන් ආලෝකයෙන් විචිත්‍රවත් වෙයි. බෝපත් මඳ සුළඟේ සිලි සිලි හඬ නංවන්නේ බැතිමතුන්ගේ සාදු නාදයට ආශිර්වාද කරන්නාක් මෙනි. මේ කරුණු පදනම් කරගෙන '' වෙසක් දා අපේ පන්සල'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න. (ලකුණු 20)

(03) පෙළපොතේ ඇතුළත් පාඩම් ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ''මං නම් අද පිටත් වෙච්ච නැකත හොඳ නෑ. අද මුළු නගරයම මහ කලබලයක්...''

(අ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවුද?
(ආ) මෙහි සඳහන් ආකාරයට නගරයයේ කලබලයට හේතුව කුමක් ද?

ii. ''දෙයක් වේ නම් යම් - සුදුස්සාට ම අයිති විය යුතු''

ම කියනා ලෙස මෙලෙද - ලැබිය යුතු අයටයි ලැබිය යුතු

(අ) ඉහත සඳහන් ගීතය ඇතුළත් වේදිකා නාට්‍යය කුමක් ද?
(ආ) එම නාට්‍යය නිෂ්පාදනය කළේ කවුද?

iii. ''මේ මොකද මගෙ අතින් අල්ලාගෙන කොහෙද මේ එක්ක යන්නෙ''

(අ) මෙම ප්‍රකාශය කරන තැනැත්තා නම් කරන්න.
(ආ) මෙලෙස අතින් අල්ලාගෙන ගියේ ඇයි?

iv. ''මේ උත්තමයාගේ රාජකාරිය එතනින් ඉවර වුණේ නෑ''

(අ) උත්තමයා යනුවෙන් හඳුන්වා ඇත්තේ කවුරුන්ද?
(ආ) මෙහි සඳහන් රාජකාරිය කුමක්ද?

v. පියාපත් වගුළ කොස්වා ලිහිණියන්ගේ අහස ගමනක් නැත්තා මෙන් <u>කෘෂිවණික්</u> ආදී සම්භව වන වස්තූන් නැති වෙයි.

(අ) මෙම පාඨය උපුටාගත් පාඩම කුමක් ද?
(ආ) ඉරි ඇඳි පදයේ අර්ථය ලියන්න. (ලකුණු 2 × 5 = 10)

(04) 2023 වර්ෂයේ සිංහල භාෂා හා සාහිත්‍ය තරඟ ජයග්‍රහණය කළ ඔබ පාසලේ සිසු සිසුවියන් ඇගයීම සඳහා උත්සවයක් ඔබ පාසලේ සාහිත්‍ය සංගමය විසින් සංවිධානය කර ඇත. එම උත්සවය 2024/03/20 දින පැවැත්වීමට සැලසුම් කර ඇති අතර එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහභාගිවීමට නියමිතය. පාසලේ සාහිත්‍ය සංගමයේ ලේකම් ඔබ යැ'යි සිතා දෙමාපියන්ට යැවීමට සුදුසු ආරාධනා පත්‍රය සකස් කරන්න. (ලකුණු 10)

(05) පහත සඳහන් ඡේදය වචන 30 ක් 35 ක් වන සේ සාරාංශ කර ලියන්න.

පාසල් අධ්‍යාපනය ලබමින් සිටින ලක්‍ෂ සංඛ්‍යාත සිසු සිසුවියන්ගේ හෙට දිනය සාර්ථක කර දීම සඳහා දෙමාපියන් මෙන්ම ගුරුවරුන්ද සිදු කරනු ලබන කැපවීම පැසසිය යුත්තකි. ශීඝ්‍රයෙන් වෙනස් වන දේශපාලන සමාජ, ආර්ථික හා සංස්කෘතික වටපිටාව හමුවේ හෙට දිනයේ දී එම දරුවන් කවරාකාර අභියෝගවලට මුහුණදීමට සිදුවනු ඇත්දැයි යන්න සිතා ගැනීමට පවා අපහසුය. අනාගතයේ දී ඔවුනට මුහුණ දීමට සිදුවන සියලු ගැටලුවලට විසඳුම අධ්‍යාපනයෙහි රඳා පවතින්නේ යැයි ගුරුවරු මෙන් ම දෙමාපියෝ ද විශ්වාස කරති. එම විශ්වාසය නිසා ම ඔවුහු දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් විශාල කැපකිරීම් කරති. බොහෝ දෙමාපියන්ගේ අභිලාෂය වී ඇත්තේ තම දූ දරුවන්ට ලබා දෙන අධ්‍යාපනය මගින් ඔවුන් සමාජයෙහි ප්‍රභූ වෘත්තීන් ලෙස සැලකෙන වෛද්‍ය, ඉංජිනේරු, කළමනාකරණ වැනි ක්ෂේත්‍රවල වෘත්තිකයින් ලෙස පත්කර ගැනීමයි. (ලකුණු 10)

(06) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දීර්ඝ කාලීනව භාෂාව ද මානව පරිණාමය හා සංවර්ධනයත් සමග ක්‍රමිකව වර්ධනය වූවකි. විවිධ ජාතීහු ඔවුනට ආවේණික වූ විවිධ භාෂා භාවිත කරති. භාෂාව දෛනිකව අලුත් වේ. අලුත් වචන එකතු වීමෙන් භාෂාව ප්‍රමාණාත්මකව වර්ධනය වේ. සමාජ සංකීර්ණත්වයත් සමග විවිධ ක්ෂේත්‍ර ආශ්‍රිත වචන රාශියක් භාෂාවට ඇතුළු විය. විවිධ ක්ෂේත්‍ර ඔස්සේ භාවිත වචන රැස්කර ගැනීමේ පුරුද්ද දියුණුවීමත් සමග කෝෂ ග්‍රන්ථ රචනා කිරීම ආරම්භ විය. ඒවා ශබ්ද කෝෂ හා විශ්ව කෝෂ ලෙස දෙවර්ගයකි. ශබ්ද කෝෂයක පරමාර්ථය වන්නේ පදයක අර්ථය පැහැදිලි කිරීම හා එහි ඉතිහාසය පිළිබඳ යම් යම් තොරතුරු සැපයීමය. එක් එක් විෂය පිළිබඳ කරුණු රැස් කර තැබීම සඳහා ලියූ ග්‍රන්ථ විශ්ව කෝෂ ලෙස හැඳින්වේ.

i. භාෂාව ප්‍රමාණාත්මකව වර්ධනය වන්නේ කෙසේ ද?

ii. කෝෂ ග්‍රන්ථ රචනා කිරීම ආරම්භවීමට බල පෑ හේතුව දක්වන්න.

iii. ශබ්ද කෝෂ රචනා කිරීමේ පරමාර්ථය කුමක්ද?

iv. එක් එක් විෂය පිළිබඳ කරුණු රැස්කර තබා ගැනීමට ලියූ ග්‍රන්ථය නම් කරන්න.

v. ඉහත ඡේදයට අනුව භාෂාවේ ලක්ෂණ දෙකක් ලියන්න.

(ලකුණු $2 \times 5 = 10$)